# දෙවන රාජසිංහ රජු සහ බලන - මහනුවර මාර්ගය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

අජිත් තල්වත්ත[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අවසන් රාජධානිය වූ කන්ද උඩරට ස්වාභාවික ආරක්ෂාවෙන් සමන්විත වූ භූමියකි. ක්‍රි. ව. 1815වන තෙක් මෙරටට ස්වාධීන ව කටයුතු කිරීමට හැකි ප්‍රමුඛ සාධකයක් වූයේ එම ආරක්ෂක පසුබිම නිසා ය. ක්‍රි.ව. 1594 පළමුවන විමලධර්මසූරිය රජු බලයට පත්වීමත් සමග උඩරට තුළ නව රජ පෙළපතක් බිහි විය. ඒ වන විට වෙරළබඩ තීරයේ රාෂ්ට්‍රමය පාලකයන් වූ පෘතුගීසීන්ට උඩරට ස්වාධීන ව පැවතීම මහත් අභියෝගයක් විය. පෘතුගීසීන් පරාජය කිරීමට ඔවුන් උත්සාහ ගත්ත ද දන්තුරේ සහ බලන සටන තුළින් උඩරටට අත්වූයේ මහත් කීර්තියකි. දෙවන රාජසිංහ රජතුමා පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම සඳහා පුළුල් කාර්ය භාරයක් ඉටු කරන ලදි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ දෙවන රාජසිංහ රජු සහ බලන සිට මහනුවර දක්වා මාර්ගය ගොඩනැගී ඇති ක්‍රමවේදයේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම යි. අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ මෙම මාර්ගය තුළ දෙවන රාජසිංහ හා බද්ධවූ විශේෂ ඓතිහාසික පසුබිමක් නිර්මාණය වූයේ ඇයි ද යන්න සොයා බැලීම යි. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය භාවිතා කිරීමේ දී ප්‍රමුඛ ලෙස පුරාවිද්‍යාත්මක ස්මාරක යොදා ගත් අතර ජනශ්‍රැති සහ සම්මුඛ සාකච්ඡා කෙරෙහි ද විශේෂ අවධානය යොමු විය. උඩරට රාජ්‍යයට ප්‍රවේශ වීමට පැවති කපොලු අතර බලන දුර්ගයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. එවකට මෙය කොළඹ - නුවර මාර්ගයේ ප්‍රධාන පිවිසුම බවට පත්ව තිබුණි. මෙම ස්ථානයේ ආරක්ෂක කොටුවක් ඉදිකර ඇත්තේ දෙවන රාජසිංහ රජතුමා විසිනි. එමගින් අපෙක්ෂා කළේ ආගන්තුකයින් මහනුවරට ඇතුළුවීම වැළැක්වීමයි. පුරාතනයේ දී මහනුවරට ප්‍රවේශ වන මාර්ගය බලන සිට අමුණුපුර, දන්තුරේ, දෙඩම්වල, ගොඩමුදුන, මුරුතලාව, ගන්නොරුව හරහා නිර්මාණය වී තිබිණි. මෙම මාර්ගයේ පිහිටි අම්බලම් අදට ද ඊට අවැසි සාක්ෂ්‍ය සපයයි. දෙවන රාජසිංහ සමයේ පහතරටින් එල්ලවූ සතුරු ආක්‍රමණ පරාජය කිරීමට ගනු ලැබූ ක්‍රියා මාර්ග නිසා ඒ හා බැඳුණු සංස්කෘතික ඉතිහාසයක් ද තිබේ. එම මාර්ගයේ ඇතැම් ස්මාරක මෙතුමාගේ නාමය හා බද්ධවීම ඊට කදිම නිදසුන් වේ. ගොඩමුදුන මාර්ගය රාජසිංහපුර යනුවෙන් වර්තමානයේ ව්‍යවහාරවීම තුළින් පවා දෙවන රාජසිංහ රජතුමා හා මෙම මාර්ගයේ පැවති සමීප බව අනාවරණය වේ.

***මුඛ්‍ය පදඃ** අම්බලම්, ආරක්ෂක, රාෂ්ට්‍රමය, මාර්ගය, පිවිසුම*

[1] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, සාමාජීය විද්‍යා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

ajiththalwatte@gmail.com

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අවසාන රාජධානිය වූ කන්ද උඩරට, අනුරාධපුර රාජධානියට පසු පැවති දීර්ඝතම කාලක් පැවති රාජධානිය වේ. උඩරට පහසුවෙන් හඳුනාගත හැක්කේ දිවයිනේ මැද පිහිටි කඳුකර ප්‍රදේශය වශයෙනි. මෙම භූමි ප්‍රදේශය අනුරාධපුර යුගයේ දී හැඳින්වූයේ කඳුරට යන අර්ථය දුන් " මලෙයි" යන දෙමළ වචනයෙන් බිඳී ආ මලය දේශ, මලය මණ්ඩල, මලය රට සහ මලයාණ්ඩු යන යන නම්වලිනි.[2] බ්‍රාහ්මී ශිලා ලේඛන විග්‍රහ කර බැලීමේදී මහනුවර සහ එහි උප නගර ක්‍රිස්තු වර්ෂායරම්භය වන විට ජනාවාසව පැවති ආකාරය වේගිරිය, දූල්වල, මොලගොඩ, ගෝනවත්ත සහ බඹරගල යන ස්ථානවල ඇති ශිලාලේඛනවලින් පැහැදිලි වේ. ක්‍රි.ව.1594 පළමුවන විමලධර්මසූරිය රජු බලයට පත්වීමත් සමග උඩරට තුළ නව රජ පෙළපතක් බිහි විය. ඒ වන විට වෙරළබඩ තීරයේ රාෂ්ට්‍රමය පාලකයන් වූ පෘතුගීසීන්ට උඩරට ස්වාධීනව පැවතීම මහත් අභියෝගයක් බව අවබෝධ කර ගත්තේය. මෙම පසුබිම පරාජය කිරීම සඳහා ඔවුන් උත්සහ ගත්ත ද දන්තුරේ සහ බලන සටන තුළින් උඩරටට අත්වූයේ මහත් කීර්තියකි. දෙවන රාජසිංහ රජතුමා පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම සඳහා පුළුල් කාර්ය භාරයක් ඉටු කරන ලදී. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ දෙවන රාජසිංහ රජු සමග බලන සිට මහනුවර දක්වා මාර්ගය ගොඩනැගී ඇති ක්‍රමවේදයේ ඓතිහාසිකත්වය අධ්‍යයනය කිරීමයි.

### සාකච්ඡාව

ස්වාධීන රාජ්‍යයක් ලෙස හැඩගැසෙමින් පැවති අවධියේදී මේ පෙදෙස සඳහා සෙංකඩගලපුර, ශ්‍රී වර්ධනපුර, හෙවත් සිරිවර්ධනපුර හා කටුපුලුනුවර යනාදී නම් කිහිපයක් ව්‍යවහාර කර තිබේ.[3] එපමණක් නොව මෙම රාජධානිය හැඳින්වීම සඳහා වෙනත් නම් කිහිපයක් ද භාවිත කොට ඇත. මහනුවර රාජධානිය ඇති වූයේ සෙංකඩගල ශ්‍රී වර්ධනපුරය මුල්කොට ගෙන ය.[4] ශ්‍රී වර්ධනපුරය ප්‍රමුඛව ආරම්භ වූ මෙම රාජධානිය කන්ද උඩරට රාජධානිය සහ කන්ද උඩ පස්රට යනුවෙන් ද හැඳින්වූ බව පෙනේ.[5] කන්ද උඩ පස්රට ලෙස ව්‍යවහාර කිරීමේදී ඇතුළත් වූ ප්‍රදේශ පිළිබඳ මූලාශ්‍රයවල වෙනස්කම් දක්නට ඇත. ගඩලාදෙණිය පුවරු ලිපියට අනුව ගංපළ, සිදුරුවාන, දෙනුවර, බලවිට, මාතලය, පන්සිය පත්තුව සහ ඌව ඇතුළු පස්රට යනුවෙන් එම උඩ පස්රට හඳුන්වා තිබූ බව මහාචාර්ය මහින්ද සෝමතිලක සඳහන් කරයි.[6] මැදවල ලිපියට අනුව සිගුරුවාන, බලවිට, මාතලය, දුම්බර සහ සගම තුන්රට යනුවෙන් නම් කොට ඇති ස්ථාන නාම පහක් පිළිබඳව කොඩ්රිංටන් මහතා විසින් පෙන්වා දෙයි. සේනාසම්මත වික්‍රමබාහු රජුගේ ගඩලාදෙණිය ශිලා ලිපියට අනුව සිදුරුවාන, දෙනුවර, බලවිට, හාරසිය පත්තුව, මාතලය, අටසිය පත්තුව, දුම්බර පන්සිය පත්තුව, ගොඩරට, මතුරට, ඌව, අටපෙඩිය, සොරම්බලවෙල, අස්ස, කොත්මලේ, ගම්පොල, දොළොස්බාගේ, බුලත්ගම, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යනාදී ප්‍රදේශ නාමයෙනුත් හැඳින් වූ බව පෙනේ. කාලය ක්‍රමයෙන් ගතවීමත් සමඟ උඩරට රාජධානියට උඩුනුවර, යටිනුවර, දුම්බර, තුම්පනේ, කොත්මලේ සහ උඩබුලත්ගම ද ඇතුළත් විය. පේරාදෙණිය, කුණ්ඩසාලේ හා හඟුරන්කෙත වැනි සුළු නගර ද එක් වූ බැවින් සෙංකඩගලපුරය මහනුවර නමින් ද හැඳින්වීමට පටන්ගත් බවට ඒ.ඩී.පී. කරුණාතිලක විසින් පෙන්වා දෙනු ලැබේ.[7] දාහත්වැනි සහ දහඅටවැනි සියවස් වන විට තවත් ප්‍රදේශ මෙම රාජධානියට අයත් වූ බව පෙනේ. දාහඋඩපස් රට බටහිරින් සත් කෝරලය, තුන් කෝරලය, පහතබුලත්ගම යන ප්‍රදේශ ද උතුරෙන් නුවරකලාවිය හා තමන්කඩුව ඇතුළු වන්නි ප්‍රදේශ ද නැගෙනහිරින් තම්පලගම් පත්තුව හා පානම ඇතුළු ප්‍රදේශ ද දකුණින් ඌව සහ සබරගමුව යන ප්‍රදේශ ද එකතුවීමෙන් බෙහෙවින් විශාල වී තිබුණි. විශේෂයෙන්ම ක්‍රි.ව. 1815 ඉංග්‍රීසින් උඩරට

[2]අබේසිංහ, ටිකිරි, දේවරාජ,ශ්‍රීමතී, සහ සෝමරත්න, ජී. පී වී. උඩරට රාජධානිය 1470-1818, පිටු. 01.

[3]සෙනෙවිරත්න, අනුරාධ, කන්ද උඩරට මහනුවර, පිටු. 01.

[4]ගමගේ ,ජී.එස්. මහනුවර යුගයේ රාජ්‍ය ආරක්ෂක ක්‍රමෝපාය, පිටු. 05.

[5]සෝමතිලක,මහින්ද ,කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය, පිටු. 43.

[6]එම,පිටු,43.

[7]කරුණාතිලක ඒ.ඩී.පී. සෙංකඩගලපුර ඉතිහාසය, පිටු. 7.

ස්වකීය අණසකට යටත් කරගන්නා සමයේ සත් කෝරලය, සතර කෝරලය, ඌව, වලපනේ, උඩපළාත, නුවර කලාවිය, මාතලේ, සබරගමුව, තුන් කෝරලය, වෙල්ලස්ස, බින්තැන්න, තමන්කඩුව, උඩුනුවර, යටිනුවර, හේවාහැට, උඩබුලත්ගම, කොත්මලේ, හාරිස්පත්තුව, දුම්බර සහ පාතබුලත්ගම යනාදී ප්‍රදේශ මහනුවර රාජධානියට අයත්ව තිබුණි. මේ අනුව තහවුරු වන්නේ කන්ද උඩරට පස්රටට අයත් වූ ප්‍රදේශ කලින් කලට වෙනස් වී පැවති බවයි.

ස්වභාවිකව පිහිටි ආරක්ෂක රැකවල්වලින් සමන්විත මෙම රාජ්‍යයේ පිහිටීම රජ දරුවන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය. රාජ්‍යයක භෞමික පිහිටීම එහි ආරක්ෂාව තහවුරුවීම පිණිස බෙහෙවින් උපකාරී විය. විශේෂයෙන්ම උඩරට රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කරන විට මෙම සංකල්පය වඩාත් පැහැදිලි වේ. උඩරට රාජධානියේ පැවති ස්වභාවය ගැන කරුණු දැක්වූ රොබට් නොක්ස් මෙසේ පවසයි."කන්ද උඩරට රාජධානිය ස්වභාව ධර්මයාගේ පරිත්‍යාගය සම්බන්ධයෙන් විශිෂ්ට සාධකයකි. එය සතුරෙකුට ප්‍රවේශ විය නොහැකි ලෙසත් පරසතුරෙකු විසින් බිඳහෙළිය නොහැකි ලෙසත් පර්වත, ප්‍රකාර සහ වලවල්වලින් හාත්පසින් ම වට වූවා වැන්න."[8] මහනුවර රාජධානියේ ආරක්ෂිත පිහිටීම මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වේ. මධ්‍යම කඳුකරයේ මහනුවර නැගෙනහිරින් උතුරින් සහ බටහිරින් ස්වභාවික වශයෙන් මහවැලි ගඟින් වටවී ඇත. මහවැලි ගංගාව මහනුවර සානුව හරහා ගමන් කරයි. හන්තාන කඳු පන්තිය උඩරට රාජධානියට මුරකාවල් සහිත බලකොටුවක් වූ අතර ආක්‍රමණිකයකුට පහසුවෙන් ළඟාවීමට නොහැකි විය.[9] මෙයට ප්‍රවේශවීම සඳහා පැවති ගිරිදුර්ග විමසීමේදී බටහිරින් බලන කපොල්ල සහ කඩුගන්නාව දුර්ගයත්, වයඹ දෙසින් ගලගෙදර දුර්ගයත්, උතුරින් බලකඩුව දුර්ගයත් පිහිටා ඇත. රාජ්‍යයට දකුණු දෙසින් හැටන් සානුව හරහා පැමිණීමට පෙර ගිනිගත්හේන කපොල්ල භාවිත කිරීම අනිවාර්ය විය. මෙම ආරක්ෂක කපොලු තරණය කිරීම බොහෝ දුරට ආගන්තුක පිරිසකට තරමක් දුෂ්කර ය.[10]

මෙම ආරක්ෂිත වාතාවරණය තුළ උඩරටට ළඟාවිය හැකි මාර්ග කිහිපයකි. ඉන් ප්‍රමුඛ වන්නේ කොළඹ-නුවර මාර්ගය යි. එය කොළඹ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයෙන් ආරම්භවී උඩරට රාජධානියට ප්‍රවේශවීමට හැකිවූයේ බලන දුර්ගය හරහා ය. ඒ අනුව අඹතලේ, කඩුවෙල, නවගමුව, හංවැල්ල, කොස්ගම, පුවක්පිටිය, අවිස්සාවේල්ල, සීතාවක, තල්දූව, ඉපත්පිටිය, නිකවලමුල්ල, රුවන්වැල්ල, අඟුරුවැල්ල, කිත්තන්තොට, කොටියකුඹුර. කරුනේගොඩ, පින්දෙණිය, ඇතුගල, තලවේල, දීවල, පතනගහ, අට්ටාපිටිය, ගණේතැන්න, බලන දුර්ගය, දොඩම්වල, ගන්නොරුව හරහා මහනුවරට ළගාවිය යුතුය.[11] මෙම මාර්ගයේ තීරණාත්මක සන්ධිස්ථානයක් වූයේ බලන දුර්ගයයි.

නිරීක්ෂණය කිරීමට හෙවත් බැලීමට යොදාගත් ස්ථානය වන්නේ බලන ය. මුහුදු මට්ටමේ අඩි 1500 උස සානුවක බලන කොටුව පිහිටා ඇත. බලන කොටුව අතිසෙයින් උඩරට රාජධානියේ ආරක්ෂාවට බලපාන ලදී. විවිධ අවස්ථාවලදී මහනුවර ආක්‍රමණය කිරීමට පැමිණීමේදී ඒවා කල් ඇතිව දැන ගැනීමේ හැකියාව මෙමගින් ලැබුණි.[12] පෘතුගීසී ජාතිකයන් උඩරට ආක්‍රමණය කරන ලද අවස්ථාවලදී බලන කොටුවේ සිට නිරීක්ෂණය කර ඔවුන්ගේ ආක්‍රමණ පිළිබඳ කල්තියා දැනගැනීමේ වාසිය සිංහලයට ලැබුණි.[13] මෙම මාර්ගයෙන් ගමන් ගත් විදේශීය හමුදාවන්ට මහත් දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුවිය. සර්පයින්, කුඩැල්ලන්ගෙන් ගහණ මාර්ගය ඔවුනට හුරුපුරුදු පරිසරයක් නොවීය. මේ නිසා උඩරට අල්ලා ගැනීම එතරම් පහසු කටයුත්තක් නොවීය. බලන කොටුවට විශාල ගල්

[8] නොක්ස් ,රොබට්,An Historical Relation of the Island of Ceylon (එදා හෙළදිව) , පරි. ඩී. කරුණාරත්න, පිටු. 51.

[9] අභයසිංහ, පී .එම් පී. උඩරට විත්ති, පිටු.1 -10.

[10] දේවරාජ ,ශ්‍රීමතී ,ලෝනා, උඩරට රාජධානිය, පරි. කුසුම් දිසානායක, පිටු. 1- 27.

[11] Hart, R.and Mejor, R."The great road"JRASCB (NS)Vol.IV, 1954, PP,143-212.

[12] අබේසිංහ, ටිකිරි, දේවරාජ,ශ්‍රීමතී, සහ සෝමරත්න, ජී. පී වී. උඩරට රාජධානිය 1470-1818, පිට. 04.

[13] එම, පිටු. 05.

ගෙනවිත් තබා ගෙන සිටි සිංහල භේවායෝ ආක්‍රමිකයණ් ගමන් කරන මාර්ගයට පෙරලීම, ගස් පෙරලීම නිසා ඔවුන්ට විශාල කරදරවලට මුහුණපෑමට සිදුවිය. සිංහලයන්ගේ මෙම ක්‍රියාව නිසා එම මාර්ගය ආරක්ෂා විය. මෙම මාර්ගයේ ප්‍රථමයෙන් බලන කොටුව ඉදිකිරීමට විමලධර්සූරිය රාජ්‍ය සමයේ අමුණුපුර මුදලිගේ ප්‍රධානත්වයෙන් කරවන ලද්දක් වුවත් විධිමත් පරිදි එය ඉදිකර ඇත්තේ දෙවන රාජසිහ රජතුමා විසින් බවට විශ්වාස කෙරේ. මෙම කොටුව සකස්කර ඇතතේ කඳුමුඳුන් දෙකක් සම්බන්ධවන පරිද්දෙනි. දකුණු පසට වෙරළුගොල්ල කන්ද පිහිටා ඇත. මෙය බඹරගල යනුවෙන් හඳුන්වන අතර එය බලන කොටුවට වඩා ඉහළින් පිහිටා තිබේ. මෙය හුලංරෝද ගල ලෙස හඳුන්වයි. දෙයින්ගේ ගල නමින් හඳුන්වන කන්ද පිහිටා ඇත්තේ වම්පස ය. විමලධර්මසූරිය රජු බලන කොටුව දැඩි මුරකාවල් යෙදූ අතර කොටුව ආරක්ෂා කිරීමට මැණික්කඩවර, ගනේතැන්න, දැදිගම යනාදි බලාකොටු ඉදිකර ඇති බව පෙනේ.

දාසයවන සියවස වන විට මෙරට පැවති ව්‍යාකූල දේශපාලන පසුබිම ක්‍රි.ව. 1505 දිවයිනට පැමිණි පෘතුගීසීන්ට බලය පිහිටුවීම සඳහා විශාල පිටුවහලක් විය. ක්‍රි.ව. 1590 වෙරළබඩ තීරයේ පාලකයන්වූ පෘතුගීසීන්ට පැවති ප්‍රධානතම අභියෝගය වූයේ උඩරට රාජධානිය ස්වාධීනව පැවතීමය. එහි බලය ලබාගැනීමට වරින් වර උත්සහ ගත්ත ද සෑම ප්‍රයත්නයක්ම අසාර්ථක විය. පළමු විමලධර්මසූරිය, සෙනරත් වැනි පාලකයින් උඩරටට ඇතිවූ පෘතුගීසි බලය සාර්ථක ලෙස මර්දනය කිරීමට කටයුතු සිදු කළහ. පෘතුගීසීන් දිවයිනෙන් නෙරපා හැරීම සඳහා පුළුල් කාර්ය භාරයක් ඉටු කළේ දෙවන රාජසිංහ රජතුමා ය. සෙසු සොහොයුරන් අභිභවා රාජසිංහ ඉදිරියට පැමිණියේ ය. ඔහු මහා අස්ථාන හෙවත් දෙවන රාජසිංහ (ක්‍රි.ව.1635-1687) නමින් උඩරට රජු බවට පත්වීම ලංකා ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවකි. දෙවන රාජසිංහ පෘතුගීසින් මෙරටින් නෙරපා දැමීමේ වටිනාකම වටහාගෙන ඒ සඳහා ලන්දේසීන්ගේ ආධාර ලබාගැනීමට කැලිකට්හි ලන්දේසී ආණ්ඩුකාරවරයාට දැන්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස බතාවියාවේ ඕලන්ද නැගෙනහිර ඉන්දියානු සමාගමේ අධ්‍යක්ෂක විසින් රජු සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමට වෙස්ටර් වෝල්ඩ් මෙහි එවන ලදී.[14] මෙසේ ගොඩනගා ගත් ලන්දේසි සබඳතාවල අවසාන ප්‍රතිඵලය වූයේ පෘතුගිසි ජාතිකයින් මුළුමනින් ම පලවා හැරීමට දෙවන රාජසිංහට හැකි වීමයි. එමෙන්ම යුරෝපා ජාතින්ගේ ආක්‍රමණවලට උපක්‍රමශීලීව මුහුණ දුන් මහනුවර සිටි ප්‍රබලතම පාලකයා ද වශයෙන් ඒ රජු සඳහන් කළ හැකි ය. ප්‍රතිකාල් පාලන ඉතිහාසයේ ඔවුන් ලැබූ අම්හිරිතම පරාජයක් ලෙස ක්‍රි.ව. 1638 ගන්නෝරු සටන පෙන්වාදීමට පුළුවන. මෙම සටන සඳහා නායකත්වය දෙනු ලද්දේ දෙවන රාජසිංහ රජතුමා ය.

ක්‍රි.ව. 1638 මාර්තු 28 වැනි දින දෙවන රාජසිංහ රජතුමාගේ සේනාව හා මෙරට පෘතුගීසි කපිතාන් ජෙනරාල්වරයා වූ දියෝගෝ ද මේලෝ කැස්තෝ විසින් මෙහෙයවන ලද පෘතුගීසි හමුදාව අතර මහවැලි ගං තෙර ගන්නෝරු සටන සිදු විය.[15] බලන දුර්ගය පසුකර උඩරටට පැමිණි දියෝගෝ ද මේලෝ කැස්තෝ ඇතුළු පෘතුගීසි සේනාව පහසුවෙන් මහනුවර පෙදෙසට පැමිණ ඉන් අනතුරුව නගරය සහ එහි පිහිටි වෙහෙර විහාර ගණනාවක් ගිනිබත්කොට විශාල හානියක් කළ බව රාජාවලියේ සඳහන් වේ.[16] එහෙත් සිංහල සේනාව අනුගමනය කළ ගරිල්ලා සටන් ක්‍රම, දේශගුණික සාධක සාධක සහ රජුගේ නායකත්වය නිසා මෙම සටන ජයක්‍රාහීව අවසන් කිරීමට හැකි විය.

ගන්නෝරු සටනේදී දෙවන රාජසිංහ බැඳි ඓතිහාසික සිදුවීම් රැසක් බලන - මහනුවර මාර්ගය හා බැඳී ඇත. බලන අමුණුපුර සිට මහා මාර්ගයේ සැතපුම් 12 ක් පමණ ඇතින් මහනුවර නගරය පිහිටියේය.[17] මහනුවරට ළඟාවීමට පෙර ගන්නෝරුව තොටුපළේදී මහවැලි ගඟ තරණය කිරීමට සිදු විය.[18] මෙම මාර්ගයේ එනම්, අමුණුපුර, මැණික්දිවෙල, දන්තුරේ, දොඩම්වල, ගොඩමුදුන, ගන්නෝරුව යනාදී ගම්වල පැවති ඉපැරණි අම්බලම් මෙම මාර්ගය නිශ්චිත වශයෙන් තහවුරු කරන සාක්ෂ්‍ය වේ.

---

[14] පෙරේරා, එස්. පී. ලංකා ඉතිහාසය පෘතුගීසි යුගය, පිටු. 101.

[15] අබේසිංහ, ටිකිරි, පෘතුගීන් හා ලංකාව. ලේක්හවුස් ප්‍රකාශන, කොළඹ, 1969, පිට.87.

[16] රාජාවලිය, 1976, පි. 236.

[17] මුණසිංහ, ඉන්ද්‍රාණි, ශ්‍රී ලංකාවේ මාර්ත ප්‍රවාහනය, කතෘ ප්‍රකාශන, 2000, පිට. 57.

[18] An Accountant of the Interior of Ceylon, Johan Davy, London, 1821, p. 363.

එහෙත් අද වන විට බොහෝ ඒවා දක්නට නැත. බලන මාර්ගයේ ඉපැරණි කොස් ගසක් ඇත. ජනප්‍රවාදවලට අනුව මෙම කොස් ගස ප්‍රදේශවාසීන් හඳුන්වන්නේ "රාජසිංහ කොස් ගස" නමිනි. ප්‍රදේශයේ පවතින ජනප්‍රවාදයන්ට අනුව දෙවන රාජසිංහ රජතුමා බලන සිට අමුණුපුර, දන්තුරේ, දෙඩම්වල, ගොඩමුදුන, මුරුතලාව, ගන්නෝරුව හරහා මහනුවර දක්වා ගමන් කළ බව සඳහන් වේ. තවත් ජනප්‍රවාදයක සඳහන් වන්නේ බලන සිට අමුණුපුර, දන්තුරේ, දෙඩම්වල, ඉඩම්පිටිය, ගොරකාදෙනිය, ගන්නෝරුව හරහා මහනුවරට පැමිණි බවය. එහෙත් ඉන් වඩාත් පිළිගත් ජනප්‍රවාදය වන්නේ පළමු අදහස වේ. අදහස් දෙකක් පැවතුන ද එම මාර්ගයේ එතුමා සම්බන්ධව පවතින ඓතිහාසික විස්තර අවබෝධ කරගත යුතුය.

දෙවන රාජසිංහ රජතුමා ඇතුළු පිරිස ඉහත කී මාර්ගයේ පැමිණීමේදී දෙඩම්වලදී ගැටලුවකට මුහුණපා ඇත. මෙම සිදුවීම සනාථ කිරීමට ප්‍රමාණාත්මක පරිදි මූලාශ්‍රය නොමැති අතර ජනශ්‍රැති කෙරෙහි විශේෂ අවධානයක් දැක්විය යුතු වේ. දොඩම්වල වර්තමානයේ ද ප්‍රකටව ඇත්තේ නාථ දේවාලය නිසා ය. ජනප්‍රවාදයන්ට අනුව මෙම ස්ථානයේ ආරම්භක අවස්ථාවේ දක්නට ලැබී ඇත්තේ දේවාලයක් නොව කෝවිලකි.[19]එය "නාහාමි කෝවිල" ලෙස හඳුන්වා ඇත. මෙය වර්තමාන දේවාලය පිහිටා ඇති ස්ථානයට පහළින් "මහා අස්න" නම් ස්ථානයේ පවතින බව අනාවරණය වේ. මෙහි ඓතිහාසික වටිනාකම තහවුරු වන්නේ ශ්‍රී ලංකාවේ වැදගත් පාලකයෙකු වන දෙවන රාජසිංහ රජු සහ මෙම ස්ථානය අතර පැවති සබඳතාවෙනි.[20]සෑම කෙම්මුර දිනයකදී ම ආවතේව කටයුතු කරන කපුරාළලා විසින් කියන කවි තුළින් දෙවන රාජසිංහ රජු හා දේවාලය අතර සබඳතාවය තහවුරු වේ.

බලනේ යුදයට ගොස් එන අතරේ
දෙවොල ළඟදී බැස යා යුතු පවරේ
කී මුත් රජහට මැතිවරු එවරේ
මහරජ නොම බැස යන සඳ මිතුරේ[21]

ඉහත සඳහන් කළ ප්‍රදේශය පසුකොට පැමිණීමේදී දොඩම්වල ආසන්නව පැවති "නියංගහමුල" නම් ස්ථානයේදී රජු හා පැමිණි පරිවාර ජනතාව විසින් රජු අමතා"රජතුමනි බලවත් දෙවිකෙනෙකු සිටින බැවින් දෝලාවෙන් බැස ගමන් කළ යුතු ය" යැයි ප්‍රකාශ කර ඇත. එවිට රජතුමා"මට වඩා දෙවියෙක් නැත, දෝලාව ඔසවන්න" ලෙස ප්‍රකාශ කර ඇත.[135] ඒ සමගම දෝලාවේ එක් අංශයක් කැඩිණ. එය සිදු වූයේ දේව හාස්කමකින් බව රජුට දැන්වීමෙන් පසු එයින් උදහස් වූ රජු වහාම දේව බලය පෙන්වා දෝලාව ප්‍රකෘති තත්ත්වයට පත් කරන ලෙස නියෝග කර තිබේ.

නවසිය පස අනුවක් සක වරුසෙ ට
රාසින් මහරජ එන කුනම පිට
බිඳුනා කුනම කැලි දෙකක ට
දෙවියන් අණසක මතු පවතින්න ට[22]

මෙම වකවානුවේ කෝවිල භාරව කටයුතු කළේ නාහාමි නැමැති කපුවෙකි. සිද්ධිය සැලවූ වහා එම ස්ථානයට පැමිණි ඔහු තම මෙහෙවර නිසියාකාර ව ඉටු කිරීමට නොහැකි වීමෙන් තම ජීවිතය පවා අහිමිවන බව අවබෝධ කරගත්තේය. පසුව ඔහු දෙවියන්ට කන්නලව් කළේ ය. අනතුරුව එම කපු මහතා බලගතු දෙවියන්ගේ සත්‍යවාදී බව පෙන්වීම සඳහා ඒ අසලින් ගලා බසිනා දිය පහරින් ජලය

---

[19] 2013- 11-28 දින එම ග්‍රාමයේ වැඩිහිටියකු වූ කේ.ඩබ්ලියු. නන්දසේන මහතා සමඟ සාකච්ඡා කර ලබාගත් තොරතුරු ඇසුරෙනි.

[20] හෝල්ට්, ජොන්, ක්ලිෆඩ්, *මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය*, පිටු. 202.

[21] තේවාව භාරව කටයුතු කරන ඩබ්.ජී.ජී.බී. දසනායක කපුමහතා මෙම කවි ප්‍රකාශ කරන ලදී.

[22] එම.

ස්වල්පයක් ගෙන පහනක් පත්තු කර ඇත. දේව මහිමය තුළින් පහන දැල්වුණු අතර දෝලාව නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වූ බවට ප්‍රදේශයේ විශ්වාසයක් තිබේ.

දේව ඇමති බිය පත් වී වැටුණා
කිරි කිරි ගා හඬ සෙනඟට ඇසුණා
සත්දිව කුනම පෙරළි වැටුණා
දේව ඇමති පසු බැස බැස වඳිනා[23]

ඉහත සිදුවීමෙන් සතුටට පත් රජු තමාට වඩා බලවත් දෙවි කෙනෙකු සිටින බව අවබෝධ කරගෙන ඒ සඳහා නොයෙක් පුද පූජා සිදුකර තිබේ. රජුගේ ඔටුන්න, දෝලාව, රාජාභරණ හා ඇඳුම්-පැළඳුම් ඒ අතර වේ. මෙම රජතුමා විසින් පූජා කළ ඔටුන් 1970 වන තෙක් පැවතුන ද පුරාවිද්‍යා එපමණක් නොව එදිනෙදා රාජකාරි සිදුකිරීමට ජනතාවට නියෝග කර රාජකාරි ඉඩම් ද ලබා දී ඇත.[24]

වැඩලා රාසිං හපුවේගල පිට
තදින් ගසා අණබෙර විජිතය වට
කරන්නට දේවාලය බුද දින සිට
පුදන්නට මගේ වස්තුව දෙවියන් හට

තනා එතන විමනක් තුන් මාලෙට
ගෙනා තොප්පි සළු රන් කඩු පුද කොට
තනා ගත්තු කුනම දෙවියන් හට
මනාපයෙන් පුද කර දේවාලෙට[25]

දොඩම්වල නාථ දේවාලයට ප්‍රවේශවීමේදී පළමුව හමුවන්නේ "රාජසිංහ සපුගස" ය. පැරණි වෘක්ෂයක් වන මේ හා සම්බන්ධ යම් සිද්ධිමාලාවක් ඇත. දෙවන රාජසිංහ රජු මෙම සපු ගස අසල වාඩිවී සිටි නිසා මෙනමින් හැඳින්වූ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ. තම දෝලාව සකසන තෙක් දෙවන රාජසිංහ වාඩිවී සිටියේ මෙම ස්ථානයේය. අදට ද එම වෘක්ෂය දක්නට ඇත. වර්තමානයේ බැතිමතුන් නොයෙක් විශ්වාස පදනම්කරගෙන විවිධ අභිචාර පවත්වති. දොඩම්වල නාථ දෙවියන්ගේ ආශිර්වාදය ලබාගැනීම පිණිස යාතිකා කිරීමේදී කපුමහතා ඉදිරිපත්කරන කරන ප්‍රකාශය ඉතා වැදගත් වේ. එමගින් ද ඉතිහාසයේ වැදගත් සිදුවීම් කිහිපයක් හෙළි වේ. එම තොරතුරු අතර දෙවන රාජසිංහ රජු පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. ....." බුදුවන්නට බලවරන් කරුණා කරන්න හාමුදුරුවෝ අස්ථාන, මහස්ථාන, කුමාරසිංහ, ඉසෝ බණ්ඩාර රාජපත් දෙවියන් වහන්සේලාගේ ද හැට හත්කට්ටුවක් දෙවිරාජෝත්තමයන් වහන්සේලාගෙන් ද බලවරන් කරුණා කරන්න හාමුදුරුවන් මාතෘ දිව්‍ය රාජයාණන් වහන්සේගේ දේවානුභාවයට, දේව කීර්තියට, ඇල්වතුරෙන් පහන් පත්තු කරුවා තිරසාරමයි. තවද රාජසිංහ රජ්ජුරුවන් වහන්සේ වඩිනා වාසල වේලාවේදී තෙතත්පාපෝ වේලාවේදී කුනම බිඳුණු වේලාවේදී තමුන්නාන්සේගේ මුල් ස්ථානයට ගෙනත් පලිගැසූ තැනේදී තිබුණාටත් වඩා පැහුනා තිරසාරමයි.... [26]

දොඩම්වල දේවාලය පසුකර යාමේදී හමුවන්නේ ගොඩමුදුන ය. ගොඩමුදුන ග්‍රාමය හැඳින්වීමේදී " රාජසිංහපුර" අදට ද ව්‍යාවහාර කෙරේ.තවද ඉඩම්පිටිය ගමෙන් වැටී ඇති මාර්ගය "රජ මාවත"ලෙස හඳුන්වයි. එලෙස හඳුන්වන්නේ දෙවන රාජසිංහ රජතුමා මෙම මාර්ගයේ ගමන් කළ නිසා බවට විශ්වාසයක් ඇත. එහෙත් මෙම කරුණු සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොමැති වුවත් ජනශ්‍රැති ප්‍රබල පිටුවහලක් ලැබේ. ගන්නොරුව ප්‍රදේශයේ සටන හැර දෙවන රාජසිංහ රජු හා සම්බන්ධ විශේෂ

---

23 තේවාව භාරව කටයුතු කරන ඩබ්.ජී.ජී.බී. දසනායක කපුමහතා මෙම කවි ප්‍රකාශ කරන ලදී.

24 එම.

25 එම.

26 තේවාව භාර කපු මහතා සමඟ සිදු කළ සාකච්ඡාව ඇසුරෙන් ලබාගත් තොරතුරු.

සිදුවීම් හමු නොවේ. පසුකාලීනව ද මෙම මාර්ගය භාවිතා කළත් ඉංග්‍රීසීන් උඩරට යටත් කරගෙන විධිමත් මාර්ග පද්ධතියක් ඉදිකිරීමෙන් පසු භාවිතයෙන් ඉවත්ව ගියේය.

**නිගමනය**

කොළඹ-නුවර ප්‍රදේශයෙන් කන්ද උඩරටට ප්‍රවේශවීමේදී බලන දුර්ගය අතිසෙයින් වැදගත් විය. එම ස්ථානය සුරක්ෂිත ලෙස ආරක්ෂා කිරීමට උඩරැටියන් ක්‍රියා කළේය. දෙවන රාජසිංහ රජතුමා බද්ධවූ විශේෂ ඓතිහාසික පසුබිමක් පැවති බව ඉහත තොරතුරු තුළින් පැහැදිලි වේ. පුරාතන මාර්ගයේ පැවති ස්මාරක අද වන විට බොහොමයක් දක්නට නැත. එහෙත් ඉංග්‍රීසීන් පැමිණීමෙන් පසු බලන හරහා මහනුවරට පැවති මාර්ගයේ වටිනාකම අඩුවිය. මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව වන්නේ උඩරටට විධිමත් හා පහසු මාර්ග ඉදිකිරීම නිසාය.